CPA

Centre for Policy Alternatives

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# 2022 ජූලි 18 වැනි දින හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි ප්‍රකාශනය

2022 ජුලි 18 වන දින, කොළඹ, ශ්‍රී ලංකාව: වර්ෂ 2022 ජුලි 17 වැනි දිනැති අංක 2288/30 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් තවත් වරක් හදිසි තත්වයක් ප්‍රකාශ කිරීම පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (Centre of Policy Alternatives-CPA) ස්වකීය දැඩි කනස්සල්ල පළ කරනු ලබයි. වර්ෂ 2022 ජුලි 15 වැනි දින වැඩ බලන ජනාධිපති රනිල් වික්‍රමසිංහ විසින් ස්වකීය නිලයේ කාර්යයන් ඉටුකිරීම ආරම්භ කිරීමෙන් පසු සිදුකරන ලද පළමු එවැනි ප්‍රකාශය මෙය වන අතර, පසුගිය මාස හතර තුළ රට තුළ එවැනි අන්දමේ හදිසි අවස්ථා ප්‍රකාශයක් සිදු කළ තෙවැනි අවස්ථාව මෙය වේ. හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මීට පෙර මේ වසරේ දෙවරක් හදිසි අවස්ථා තත්ත්වය ප්‍රකාශයට පත් කළ අතර ඔහුගේ ජනාධිපති ධුර කාලය තුළ තෙවරක් එසේ හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කරන ලදී.

හදිසි අවස්ථාව ප්‍රකාශ කළ හැක්කේ සීමිත සහ සුවිශේෂී අවස්ථාවන්හිදී පමණක් බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් නැවත අවධාරණය කරනු ලබන අතර, එවැනි හදිසි අවස්ථාවක් පැන නැගී නොමැති විට, මහජන විසම්මුතිය යටපත් කිරීමේ එක් උපායමාර්ගයක් ලෙස, කලින් කලට බලයට පත් වූ ජනාධිපතිවරුන් විසින් මෙම බලය අනිසි ලෙස භාවිතා කිරීම කිසිසේත් අනුමත කළ නොහැක. සාමාන්‍ය ව්‍යවස්ථාදායක සීමාවෙන් ඔබ්බට දිවෙන මෙකී තත්ත්වය ඔස්සේ නීති සම්පාදනය කිරීමට ජනාධිපතිවරයාට ඉඩ සලසන මෙම අසාමාන්‍ය බලය, ජනාධිපතිවරුන් තම ලැදියාවන් ආරක්ෂා කර ගැනීමට උත්සාහ කරන පුද්ගලික අපයෝජන මෙවලමක් ලෙස භාවිතයට ඇති ඉඩ ප්‍රස්ථාව වෙනුවට එය වඩාත් සුවිශේෂී අවස්ථාවන්ට පමණක් අදාල වන ආකාරයට සීමා විය යුතුය. මෙම අවස්ථාවේ දී හදිසි තත්ත්වයක් පැනවීමට අවශ්‍යතාවයක් උද්ගත කරන තත්ත්වයන් පවතින බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් විශ්වාස නොකරන අතර හදිසි තත්තවයක් පැනවූයේ කවර සාධක පදනම් කරගෙන දැයි පැහැදිලි කරන ලෙස වැඩබලන ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටී. කිසිදු පිළිගත හැකි පැහැදිලි කිරීමක් නොමැති පසුබිමක් තුළ, හදිසි අවස්ථාවක් ප්‍රකාශ කිරීම ඔස්සේ එය අවසාන වශයෙන් සමාජයේ පවතින විසම්මුතිය යටපත් කිරීමේ ක්‍රමානුකූල වූත් විනාශකාරී වූත් භාවිතයක් පමණක් බව පෙන්නුම් කෙරේ.

ශ්‍රී ලංකාව පෙර නොවූ විරූ දේශපාලන හා ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටින මෙවන් අවස්ථාවක සහ රජයේ ප්‍රමුඛතාවය විය යුත්තේ එකී තත්ත්වයෙහි යම් ස්ථාවරත්වයක් සහතික කිරීම සහ සමාජයේ පුරවැසියන්ගෙන් සැලකිය යුතු කොටසක් අත්විඳින ආර්ථික දුෂ්කරතා සහ ආහාර අනාරක්ෂිත භාවයට පිළියම් යෙදීමට පියවර ගැනීම වන පසුබිමක උක්ත කී අන්දමේ හදිසි අවස්ථාවමය තත්වයක් ප්‍රකාශ කිරීම කිසිසේත්ම ප්‍රතිඵලදායක නොවන බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පෙන්වා දේ. ස්වකීය පුරවැසියාගේ අයිතිවාසිකම් ලබාදීමේ සහ ඒවා ආරක්ෂා කිරීමේ මූලික වගකීම ඉටු කිරීමට ආණ්ඩුව අසමත්ව ඇති පසුබිමක ආණ්ඩුව සහ රාජ්‍ය පාලනය පිළිබඳ ජනතා විශ්වාසය තවදුරටත් පළුදු කරන අන්දමේ අත්තනෝමතික ක්‍රියාමාර්ග අනුමනය කිරීම සඳහා පෙලඹීම ඉතා අවාසනාවන්ත තත්ත්වයකි. මේ අනුව, හදිසි තත්වයක් පැනවීමේ ප්‍රකාශය වහාම අවලංගු කරන ලෙසත්, ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලීන් ආරක්ෂා කිරීමට අවශ්‍ය සියලු පියවර ගන්නා ලෙසත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් වැඩබලන ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටී.

Centre for Policy Alternatives

Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka

Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org